ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## පුවත්පත් නිවේදනය

**මිත්‍ර ශක්ති - VI ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා ඉන්දීය හමුදා සාමාජිකයන් පැමිණේ**

ශ්‍රී ලංකා හමුදාව සහ ඉන්දීය හමුදාව අතර මිත්‍ර ශක්ති VI ඒකාබද්ධ යුධ අභ්‍යාසය 2019 මාර්තු 26 වන දින සිට අප්‍රේල් 08 වනදා දක්වා දියතලාවෙදී පැවැත්වේ. මෙම යුධ අභ්‍යාසය එක් වසරකදී ඉන්දියාවෙද ඊළඟ වසරේදී ශ්‍රී ලංකාවෙද පැවැත්වෙන වාර්ෂික වැඩසටහනකි. මිත්‍ර ශක්ති - V ඒකාබද්ධ යුධ අභ්‍යාසය ඉන්දියාවේ පූනේ හිදී පැවැති අතර ඒ සඳහා ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් 120 දෙනෙකු සහභාගී විය. මෙවර දෙසතියක් පුරා පැවැත්වෙන ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා හමුදා නිලධාරීන් 11 දෙනෙකු ඇතුළු ඉන්දීය හමුදා නිලධාරීන් 120 දෙනෙකු 2019 මාර්තු 25 වන දින ඉන්දීය ගුවන් හමුදාවේ IL-76 ප්‍රවාහන ගුවන්යානයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ශ්‍රී ලංකාවට පැමිණියහ. මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය කලාපය තුළ පැවැත්වෙන විශාලතම ද්විපාර්ශවීය හමුදාමය අභ්‍යාසයක් වේ. පසුගිය අභ්‍යාසයන්හි සාර්ථකත්වය සැලකිල්ලට ගෙන මිත්‍ර ශක්ති යුධ අභ්‍යාසය මෑතකදී මූලික මට්ටමේ සිට සියලු අංශ ආවරණය වන අභ්‍යාසයක් දක්වා වැඩි දියුණු කර ඇත.

දෙරටෙහි නාවික හමුදාවන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය සහ තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන කටයුතු ශක්තිමත් කිරීම සහ වෘත්තීය ගෞරවය, පෞද්ගලික බැඳීම් සහ පුළුල් පුහුණු ක්‍රියාකාරකම් මත පදනම් වූ සුහද සම්බන්ධතාවයක් ගොඩනැගීමට අවස්ථාව සලසා දීම මෙම අභ්‍යාසයෙහි මූලික අරමුණු අතර වේ. අන්තර් රාජ්‍ය ත්‍රස්තවාදයට සාර්ථකව මුහුණ දීම, ඒකාබද්ධ යුධෝපාය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ සටන් කුසලතා වර්ධනය කරගැනීම යනාදියට මෙම අභ්‍යාසය උපකාරී වනු ඇත. එකිනෙකාගේ අත්දැකීම් බෙදාහදා ගැනීමටද දෙරටෙහි හමුදාවන් විසින් අනුගමනය කරන ක්‍රියාදාමයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටද මෙම අභ්‍යාසය මනා වේදිකාවක් වනු ඇත. ත්‍රස්තවාදී ව්‍යසනය සහ අනෙකුත් පොදු තර්ජනයන්ට එරෙහිව සාර්ථකව සටන් කිරීම සඳහා සහයෝගීතාවය වර්ධනය කර ගැනීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දක්වන උනන්දුව මෙම අභ්‍යාසය මගින් පිළිඹිබු කෙරේ. මෙම වසරේදී අභ්‍යාසයේ වපසරිය සැලකිය යුතු ලෙස පුළුල් කර ඇති අතර මූලික මට්ටමේ

වැඩසටහන් වලට අමතරව කාලතුවක්කු, ඉංජිනේරු, සංඥා, වෛද්‍ය සහ විශේෂ යන බලකායන්ගේ සාමාජිකයන්ද මෙම අභ්‍යාසය සඳහා සහභාගී වනු ඇත.

මෙම අභ්‍යාසය දියතලාවේදී පැවැත්වෙන අතර ශ්‍රී ලංකා හමුදාවේ ගැමුණු බලකායද ශ්‍රී ලංකා හමුදාවේ කාලතුවක්කු , ඉංජිනේරු සහ සංඥා වැනි බලකායන්ද මේ සඳහා සහභාගී වනු ඇත . මෙම අභ්‍යාසය දේශන සහ ඉදිරිපත්කිරීම්, කුඩා කණ්ඩායම් උපාය මාර්ගික මෙහෙයුම් , සන්නිවේදන සහයෝගීතාවය, වෙඩිතැබීමේ පුහුණු සහ මානුෂීය ආධාර සහ ආපදා සහන මෙහෙයුම් යනාදියෙන් සමන්විත වනු ඇත.

දෙරටෙහිම හමුදා සාමාජිකයන්ට එකිනෙකාගෙන් ඉගෙන ගැනීමටද පොදු වටිනාකම් තවදුරටත් තහවුරු කරගැනීමටද මිත්‍ර සබඳතා ගොඩනගා ගැනීමටද අවස්ථාවන් හිමිකර දෙන ක්‍රීඩා සහ සංස්කෘතික වැඩහටහන්ද මෙම අභ්‍යාසය තුළට ඇතුළත් කර ඇත.

****

2019 මාර්තු 26
කොළඹ